# ව්‍යාපාර අධ්‍යයනය - 1 ඒකකය - ව්‍යාපාර පදනම

1.මිනිස් අවශ්‍යතා හා වුවමනා වෙන් වෙන්ව හඳුනාගත හැකිය.මිනිස් අවශ්‍යතා පමණක් අන්තර්ගත කාණ්ඩය කුමක්ද?

1.ඇඳුම්,නිවාස,ආහාර,ගොඩනැගිලි
2.රසවින්දනය,ජලය,වාතය,ආහාර
3.බත්,ජලය,ඇඳුම්,අධ්‍යාපනය
4.නිවාස,සන්නිවේදනය,විදුලිය,ඇඳුම්
5.රියදුරු,අධ්‍යාපනය,ආහාර,වෛද්‍ය සේවය

2.ව්‍යාපාර යන්න නිවැරදිව අර්ථ දක්වා ඇත්තේ,

1.නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා භාණ්ඩ හා සේවා බෙදාහැරීමේ මුළු මහත් ක්‍රියාවලියකි.
2.ලාභ ලැබීමේ අරමුණින් නිෂ්පාදිතයන් බිහිකිරීමේ නියුතු ආයතනයන්ය.
3.ලාභ ලැබීමේ අරමුණින් කරනු ලබන ඕනෑම කටයුත්තකි.
4.මානව අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වූ ඕනෑම ආර්ථික කටයුත්තකි.
5.අමුද්‍රව්‍ය නිමිද්‍රව්‍ය බවට පත්කිරීමේ කාර්යයේ නියුතු ආයතනයන්ය.

3.පහත දැක්වෙන්නේ නිෂ්පාදන අවස්ථා පැහැදිලි කරන ප්‍රකාශ කිහිපයකි.

A - වසන්ත මහතා තම වින්දනය සඳහා දේශීය ඖෂධ සහිත ඔසු උයනක් නඩත්තු කරයි.
B - පත්මා මහත්මිය ඇඳුම් නිර්මාණය සඳහා විශේෂ දක්ෂතාවයක් දක්වන අතර ඇය තම දියණියන් සඳහා නවතම විලාසිතාවන්ගෙන් යුත් ඇඳුම් නිර්මාණය කරයි.
C - සුනෙත් සූර්ය ශක්තියෙන් ක්‍රියාකරන පරිගණකයක් නිපදවා ඒ පිළිබඳව පේටන්ට් බලපත්‍රයක් ලබා ගෙන සිටී.
D - තුෂාරි මහත්මිය මලින් කරන සැරසිලි සඳහා විශේෂ දක්ෂතාවක් දක්වන අතර,ඇය මංගල හා වෙනත් උත්සව සැරසිලි සඳහා ඇණවුම් භාරගෙන ඒවා ඉටු කරනු ලබයි.
E - විශ්‍රාමික ගුරුභවතෙකු වන සරත් මහතා තම කාලය වැය කරන්නේ සිය වින්දනය සඳහා ළමා නවකථා රචනයටයි.

ඉහත ප්‍රකාශ පිළිබඳව නිවැරදිව විස්තර ඇති කාණ්ඩය වනුයේ,

1.A සහ E ඍජු නිෂ්පාදන අවස්ථා වන අතර B වක්‍ර නිෂ්පාදන අවස්ථාවකි.
2.A,B,C සහ E ඍජු නිෂ්පාදන අවස්ථා වන අතර D වක්‍ර නිෂ්පාදන අවස්ථාවකි.
3.A,C සහ E ඍජු නිෂ්පාදන අවස්ථා වන අතර B වක්‍ර නිෂ්පාදන අවස්ථාවකි.
4.A,B,C සහ E වක්‍ර නිෂ්පාදන අවස්ථා වන අතර D ඍජු නිෂ්පාදන අවස්ථාවකි.
5.ඉහත සියලු ප්‍රකාශන ඍජු නිෂ්පාදන අවස්ථා වේ.

4.පහත දැක්වෙන්නේ පුද්ගලයන් සිව්දෙනෙකු හා සම්බන්ධ සිද්ධීන් හතරකි.

A - සුගත් තමන් භාවිතා කළ පැරණි යතුරු පැදිය විකිණීම.

B - ගිහාන්ගේ මෝටර් රථ අමතර කොටස් අලෙවිසැලෙහි ගින්නක් ඇතිවීම.

C - රසිකා නිවසේ සිට මසන ඇඳුම් පමුණුව රෙදිපිළි අලෙවිසැල්වලට අලෙවි කරයි.

D - සමන් නිපදවන වතුර පෙරනයන් වකුගඩු රෝගීන්ගේ පවුල්වලට නොමිලේ බෙදා හරිනු ලබන්නේ සමාජ සත්කාර සේවාවක් ලෙසිනි.

මේ අතරින් ව්‍යාපාරයක ගති ලක්ෂණ ඇතුළත් සිද්ධීන් කවරේද?

1.B හා C පමණි.

2.B,C හා D පමණි.

3.C හා D පමණි.

4.A,B හා C පමණි.

5.A හා C පමණි.

5.ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා නිවැරදි පිළිවෙලට දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

1.භාණ්ඩ හුවමාරුව,මුදල් භාවිතය,කාර්මික විප්ලවය,තොරතුරු ආර්ථිකය

2. භාණ්ඩ හුවමාරුව,මුදල් භාවිතය,ගෝලීයකරණය,තොරතුරු ආර්ථිකය

3.කාර්මික විප්ලවය,භාණ්ඩ හුවමාරුව,මුදල් භාවිතය,තොරතුරු ආර්ථිකය

4.ගෝලීයකරණය,භාණ්ඩ හුවමාරුව,මුදල් භාවිතය,තොරතුරු ආර්ථිකය

5.තොරතුරු ආර්ථිකය,භාණ්ඩ හුවමාරුව,කාර්මික විප්ලවය,මුදලේ විකාශනය

6.නිමි ඇඳුම් නිෂ්පාදනය කරන ආයතනයක යෙදවුම් අතරින් භූමිය සහ ප්‍රාග්ධනය නැමති යෙදවුම්වලට අදාළ වන සාධක කිහිපයක් පහත දැක්වේ.

A - ගොඩනැගිලි පිහිටා ඇති ඉඩම

B - ගොඩනැගිල්ල

C - මහන මැෂින් උපකරණ

D - ගොඩනැගිල්ලට ලැබෙන වාතාශ්‍රය

E - බෙදා හැරීමේ රථ

F - රෙදි,නූල්,බොත්තම්

මෙම සාධකවලින් ප්‍රාග්ධනයට අදාළ කරුණු පමණක් දැක්වෙන කාණ්ඩය තෝරන්න.

1.A,B,C,D

2.B,C,D,E

3.B,C,E,F

4.A,C,E,F

5.C,D,E,F

7.නව කොරෝනා (කොවිඩ් 19) වසංගතය පැතිරී ගිය සමයේ විෂබීජ නාශක දියර නිෂ්පාදනය කරන සමාගම් අලෙවිය සඳහා විෂබීජනාශක දියර නිෂ්පාදනය කිරීම අයත් වනුයේ,

1.ප්‍රාථමික අංශයේ ව්‍යාපාරවලටය.
2.නිෂ්කර්ශක කර්මාන්තවලටය.
3.සේවා අංශයේ ව්‍යාපාරවලටය.
4.තෘතියික අංශයේ ව්‍යාපාරවලටය.
5. ද්විතියික අංශයේ ව්‍යාපාරවලටය.

8.පහත වගුවේ දැක්වෙන්නේ සාර්ව පාරිසරික සාධක කිහිපයක් හා එම සාධක සඳහා නිදසුන් කිහිපයකි.

| සාර්ව පරිසර සාධක | නිදසුන් |
|---|---|
| A.ප්‍රජා විද්‍යාත්මක | 1.රොබෝ තාක්ෂණය දියුණු වීම. |
| B.තාක්ෂණික | 2.වයස්ගත ජනගහනයේ වර්ධනය |
| C.ආර්ථික | 3.ලෝක වෙළෙඳපොලේ තෙල් මිල ඉහළ යාම. |
| D.දේශපාලන | 4.භාවිතා කළ හැකි පොලිතීන් ඝණත්වය නියම කිරීම. |
| E.නීතිමය | 5.පස් අවුරුදු ජාතික සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කිරීම. |

සාර්ව පාරිසරික සාධක හා නිදසුන් නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.

1.)A – 1,B -2 ,C – 3 ,D – 4, E - 5
2.)A – 4,B – 5 ,C – 2,D – 3 ,E - 1
3.)A – 2 ,B – 1, C – 3 ,D – 5 ,E - 4
4.)A – 4 ,B – 3 ,C – 5 ,D – 2 ,E - 1
5.)A – 2 ,B – 1 ,C – 5 ,D – 3, E – 4

9.විද්‍යුත් වාණිජ්‍යය ප්‍රසාරණය වීම නිසා ලැබිය හැකි ප්‍රතිලාභයක් නොවන්නේ,

1.අන්තර්ජාතික වෙළෙඳපොලට පිවිසීමට අවස්ථාව ලැබීම.
2.භාවිතා කළ හැකි ලියවිලි අඩුවීම.
3.විදුලිබලය නොමැති ග්‍රාමීය ජනතාවට මිලදී ගැනීම හා විකිණීම පහසුවෙන් සිදු කළ හැකි වීම.
4.බොහෝ දෙනෙකුට නිවසේ සිට රැකියා කිරීමට අවස්ථාව සැලසීම.
5.තොග රඳවා ගැනීමේ අවශ්‍යතාව අවම වීම.

10.තෘතියික ව්‍යාපාර අංශයට අයත් කාණ්ඩය වනුයේ,

1.කෘෂි ව්‍යාපාර,ප්‍රවාහන ව්‍යාපාර,බැංකු ව්‍යාපාර,සංචාරක ව්‍යාපාර
2.වෙළෙඳාම,ප්‍රවාහන සේවා,නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීමේ ව්‍යාපාර
3.ඉදිකිරීම්,කර්මාන්ත,රක්ෂණ සේවා,සන්නිවේදන සේවා හා කෘෂි ව්‍යාපාර

4.ධීවර කටයුතු,බැංකු සේවා,පතල් කැණීම් හා කෘෂි ව්‍යාපාර
5.බැංකු සේවා,ගෑස් සැපයීමේ සේවා,ඉදිකිරීම් කර්මාන්ත හා ධීවර කර්මාන්ත ව්‍යාපාර

## පිළිතුරු

| | |
|---|---|
| **1.) 2** | **6.) 3** |
| **2.) 4** | **7.) 5** |
| **3.) 2** | **8.)3** |
| **4.) 2** | **9.) 3** |
| **5.) 1** | **10.) 2** |

**සකස් කළේ ,**
**අනෝමා අතපත්තු මිය,**
**ර/පාතකඩ බෞද්ධ ම.වි.**

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

[www.ALNoteBook.com](http://www.ALNoteBook.com)

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."